සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

84 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

ශිල්ප කලා	I, II
நுண்கலை	I, II
Arts and Crafts	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය	- මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	- 10 நிமிடங்கள்
Additional Reading Time	- 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශිල්ප කලා I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සෞභාග්‍ය, ප්‍රීතිය, විනෝදය, දුක, සැප සියලු හැඟීම් ප්‍රකාශනය සඳහා යොදා ගන්නා ජන කලාව වන්නේ,

(1) ලී කැටයම් කලාව ය. (2) බීරළු කලාව ය.
(3) වෙස් මුහුණු කලාව ය. (4) ස්වර්ණාභරණ කලාව ය.

2. තල ජ්‍යාමිතික හැඩතල පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1)

(2)

(3) 

(4) 

3. විහිත චතුරස්‍ර යුගලයේ අන්තර්ගත කෝණ අගයන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) 30°, 45°, 60°, 90° (2) 45°, 60°, 75°, 90°
(3) 45°, 60°, 75°, 80° (4) 30°, 60°, 90°, 120°

4. ———— — ———— — ———— —

ඉහත රූපයේ දැක්වෙන්නේ කාර්මික ඇඳීමේ දී භාවිත කරන සම්මත රේඛා වර්ගයකි. මෙම රේඛා භාවිත කරනු ලබන්නේ,

(1) නිර්මාණයක සැඟි දාර දැක්වීමට ය.
(2) නිර්මාණයේ පෙනෙන දාර දැක්වීමට ය.
(3) ඡේදනය වන ස්ථාන දැක්වීමට ය.
(4) මධ්‍ය අක්ෂය හෝ සමමිතික බව දැක්වීමට ය.

5. රූපයේ සේයා කර ඇති වෘත්ත කොටස හඳුන්වන්නේ කුමන නමින් ද?

(1) වෘත්ත පාදය
(2) ජ්‍යාය
(3) කේන්ද්‍රික ඛණ්ඩය
(4) වෘත්ත ඛණ්ඩය



6.



ඉහත රූපයේ දැක්වෙන නිර්මාණයේ x කෝණයේ අගය වන්නේ,
(1) 15° කි. (2) 30° කි. (3) 40° කි. (4) 60° කි.

7.



ඉහත රූපයේ දක්වා ඇති නිර්මාණයේ,
- පාද සියල්ල දිගින් එකිනෙක සමාන වන අතර සම්මුඛ කෝණ සමාන වේ.
- විකර්ණ දිගින් අසමාන වුව ද සෘජු කෝණිකව ඡේදනය වේ.
- සම්මුඛ පාද දිගින් සමාන හා සමාන්තර වේ.

මෙම ජ්‍යාමිතික හැඩතලය හඳුන්වන්නේ,
(1) සමචතුරස්‍රයයි. (2) රොම්බසයයි. (3) රෝම්බාභයයි. (4) සෘජුකෝණාස්‍රයයි.

8. ඝන වස්තුවක වක්‍ර පෘෂ්ඨයේ විකසනය සෘජුකෝණාස්‍රයක හැඩය ගනු ලබන්නේ,
(1) ඝනකයක ය. (2) සිලින්ඩරයක ය. (3) ගෝලයක ය. (4) පිරමීඩයක ය.

9. චාප ක්‍රමය අනුව ඉලිප්සයක් නිර්මාණයේ දී ලබා දිය යුතු දත්ත වන්නේ,
(1) මහ අක්ෂයේ හා සුළු අක්ෂයේ දිග ප්‍රමාණය යි.
(2) නාභි දෙක අතර දුර ය.
(3) නියාමක අක්ෂයේ සිට සුළු අක්ෂය දක්වා දුර ය.
(4) ඡේදිත ලක්ෂයේ සිට නියාමක අක්ෂය දක්වා දුර ය.

10. පහත ප්‍රකාශ සලකන්න.
A - සම්පත් නාස්තිය අවම කර ගත හැකි වීම
B - නිමැවුමේ ශක්තිමත් බව වැඩි වීම
C - නිවැරදිව ක්‍රමානුකූලව නිර්මාණ රාශියක් තනා ගත හැකි වීම

ඉහත ප්‍රකාශ අතරින් නිර්මාණ ක්‍රියාවලියේ දී විකසන චිත්‍ර ඇඳ ගැනීමෙන් ලැබෙන වාසි සඳහන් ප්‍රකාශ මොනවා ද?
(1) A හා C පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ලම ය.

11. තාප බන්ධිත ක්‍රමයේ දී අනුගමනය කරනු ලබන පියවර කිහිපයක් පහතින් දැක්වේ.
A - මෝස්තරය හෝ හැඩතල තනි පැහැති හෝ මුද්‍රිත රෙදි කැබැල්ලකින් කපා ගැනීම
B - රෙදි කැබැල්ල පෙර පිරියම් කිරීම
C - කපාගත් හැඩතල තාපබන්ධිත කඩදාසියේ රළු මතුපිට තබා මෝස්තරය මත පමණක් හොඳින් රත් වූ ස්ත්‍රික්කයකින් මැදීම
D - අලවාගත් මෝස්තර කොටසු කඩදාසියෙන් කපා වෙන් කිරීම
E - මෝස්තරය සලකුණු කර ගත් ස්ථානයේ තබා රත් වූ ඉස්ත්‍රික්කයකින් ස්ථාවර කිරීම

මෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A, B, C, D, E (2) B, A, C, D, E (3) C, D, E, A, B (4) D, A, B, C, E

12. මුද්‍රණය විය යුතු කොටස ඉතිරි කර අනෙකුත් කොටස් වාර්නිෂ් ස්ථරයක් සහ ලැකර් ස්ථරයක් ආලේප කිරීම මගින් මෝස්තර රටා සකස් කර ගනු ලබන්නේ,
(1) අතින් පින්තාරු කිරීමේ දී ය. (2) තිර රාමු මුද්‍රණ ක්‍රමයේ දී ය.
(3) සිදුරු තහඩු ක්‍රමයේ දී ය. (4) අච්චු මුද්‍රණ ක්‍රමයේ දී ය.

13. පින්තාරු කිරීමේදී වැඩි ප්‍රදේශයක් එකවර වර්ණ ගැන්වීම සඳහා වඩාත් සුදුසු පින්සල් වර්ගය වන්නේ,
(1) සියුම් නිමා පින්සල් ය. (2) රවුම් පින්සල් ය.
(3) පැතලි පින්සල් ය. (4) සේදුම් පින්සල් ය.

14. රෙදි නිෂ්පාදනයේ දී භාවිත කෙරෙන ස්වාභාවික කෙඳි අතරින් කාබනීකරණයට ලක්කර භාවිතයට ගැනෙන්නේ,
(1) කපු කෙඳි ය. (2) ලෝම කෙඳි ය. (3) හණ කෙඳි ය. (4) සේද කෙඳි ය.

15. කෘත්‍රිම ආභරණ සකස් කිරීමේ දී කල් පවත්නා පරිසර හිතකාමී අමුද්‍රව්‍ය ලෙස භාවිත කළ හැකි වන්නේ,
(1) කඩදාසි ය. (2) ප්ලාස්ටික් ය. (3) කම්බි ය. (4) වීදුරු ය.

16. රෙදි කැබලි භාවිතයෙන් සිදු කෙරෙන විසිතුරු නිර්මාණ ක්‍රියාවලියේ දී අනුගමනය කෙරෙන පියවර කිහිපයක් පහත දැක්වේ.
A - පතරොම භාවිතයෙන් රෙදි කැබලි කපා ගැනීම
B - පතරොම් සකස් කර ගැනීම
C - සේදීම මගින් වර්ණ වෙනස් නොවන විවිධ වර්ණවලින් යුතු රෙදි තෝරා ගැනීම
D - මනා නිමාවක් සහිතව නිර්මාණය සැකසීම
E - නිවැරදි මැහුම් ක්‍රම යොදා ගනිමින් රෙදි කොටස් එකලස් කිරීම
එහි නිවැරදි අනුපිළිවෙල දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B, C, D, E (2) B, A, C, D, E (3) C, B, A, E, D (4) E, A, C, D, B

17. බතික් නිර්මාණ ක්‍රියාවලියේ දී ඉටි මිශ්‍රණය සකස් කර ගැනීම සඳහා ද්විත්ව උණුසුම් ක්‍රමය භාවිත කරනුයේ,
(1) පහසුවෙන් ඉටි උණු කර ගත හැකි නිසා ය.
(2) ඉටි මිශ්‍රණයේ උෂ්ණත්වය ඒකාකාරීව පවත්වා ගැනීම සඳහා ය.
(3) වැය වෙන ඉටි ප්‍රමාණය අවම කර ගැනීම සඳහා ය.
(4) ඉටි ඉවත් කර ගැනීමේ පහසුව සඳහා ය.

18. ගෙතුම් නිර්මාණ කිරීමේ දී ආරම්භක පියවර වන්නේ,
(1) තනිපට පිරවිල්ල ගෙතීම ය. (2) දෙපට පිරවිල්ල ගෙතීම ය.
(3) දම්වැල ගෙතීම ය. (4) පත්තෑයා ගෙතීම ය.

19. තිර රාමු මුද්‍රණයේ දී ආලෝක සංවේදී ක්‍රමය යටතේ තිරයේ ආලේප කිරීමට භාවිත කරනු ලබන රසායනික ද්‍රව්‍ය අඩංගු බාණ්ඩය වන්නේ,
(1) සෝඩියම් ක්ලෝරයිඩ්, කෝස්ටික් සෝඩා, ජෙලටින් ය.
(2) කෝස්ටික් සෝඩා, ක්ලැටැක්, සෝඩියම් ක්ලෝරයිඩ් ය.
(3) ක්ලැටැක්, ජෙලටින්, ඩයික්‍රෝමේට් ය.
(4) ජෙලටින්, ටිනර්, ඩයික්‍රෝමේට් ය.

20. රෙදි පිළි නිෂ්පාදනයේ දී සායම් ස්ථිර කර ගැනීම හා කල් පවත්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ. ඒ සඳහා සිදු කරන ක්‍රියාවලිය වන්නේ,
(1) විරංජනය යි. (2) පෙර පිරියම් කිරීම යි.
(3) කාබනීකරණය යි. (4) පසු පිරියම් කිරීම යි.

21. යන්ත්‍රගත කරන ලද හැදයකට හරස් නූල් යොදා ගැනීමෙන් රෙදි වියා ගැනේ. මෙසේ වියීම සඳහා හරස් නූල් යොදා ගැනීමට භාවිත කරනු ලබන උපාංගය වන්නේ,
(1) නඩාව ය. (2) එතුම් රෝදය ය. (3) නූල් බෙරය ය. (4) මල් චක්‍රය ය.

22. මෙට්‍රික් අංක 12 ක් වූ තනිපොට නූල් කැරලි මිටියක බර 5 kg කි. එහි අඩංගු නූල් කැරලි ගණන කීය ද?
(1) 05 (2) 12 (3) 50 (4) 60

23. අත් පිස්නා හැදයක් වියීම සඳහා දෙපොට නූල් කැරලි 10 ක් වැය වී ඇත. කිලෝග්‍රෑම් එකකට එම නූල් කැරලි 20ක් අඩංගු වන්නේ නම්, එම නූලේ අංකය වන්නේ,
(1) $2/20^S$ ය. (2) $2/30^S$ ය. (3) $2/40^S$ ය. (4) $2/50^S$ ය.

24. දිග මීටර් 50ක් ද පළල සෙන්ටිමීටර් 20ක් වූ ද බඳුන් පලස් (Table mats) විවීම සඳහා එක් සෙන්ටිමීටරයකට නූල් පොටවල් 30ක් යොදාගෙන ඇත. එම හැදයේ මුළු දික් නූල් පොටවල් ගණන කීයද?
(1) $50 \times 20 = 1000$ (2) $20 \times 30 = 600$ (3) $50 \times 30 = 1500$ (4) $50 \times 20 \times 30 = 30000$

25. නූල්වලට අංක ලබා දී ඇත්තේ පහසුවෙන් හඳුනා ගැනීම සඳහා ය. තිර රෙද්දක් වියා ගැනීමට භාවිත කර ඇති නූලක අංකය $2/20^S$ කි. එම නූල් විශේෂය හඳුන්වනු ලබන්නේ,
(1) තනිපොට නූල් ලෙස ය. (2) දෙපොට නූල් ලෙස ය.
(3) තුන්පොට නූල් ලෙස ය. (4) වැඩිපොට නූල් ලෙස ය.

26. ගවුම් රෙදි, සාරි, චිත්ත රෙදි ආදී රෙදි වර්ග වියා ඇත්තේ එක ම වියමන් රටාවක් වූ වාම් වියමන් රටාවෙනි. පහත රටා අතුරින් වාම් වියමන තෝරන්න.


(1)

(2)

(3)

(4)

27. පහත සඳහන් වියමන් රටා අතුරින් ඩෙනිම් රෙදි විවීම සඳහා භාවිත වන වියමන් රටාව කුමක් ද?


(1)

(2)

(3)

(4)

28. විවීමේ යන්ත්‍රවල රටාවට අනුව නූල් ඇදීමට භාවිත කරන්නේ පුඩුවැල් ජේලි (Heels) ය. පහත රූප සටහන් අතුරින් පුඩුවැල් ජේලිය තෝරන්න.


(1)

(2)

(3)

(4)

29. හැදයක් ඇමීමේ දී නූල් දිග් ගසා ගැනීම සඳහා උපකරණ කට්ටලයක් භාවිත කෙරේ. හැදයට සීරු දමා ගැනීමට භාවිත කෙරෙන උපකරණය වන්නේ,
(1) නූල් බෙත්ම ය. (2) දික් නූල්කුරු රාක්කය ය.
(3) නූල් බෙරය ය. (4) ලීවර රාමුව ය.

30. පේෂකර්ම අත් යන්ත්‍ර නිෂ්පාදනයේ දී විවිධ කාර්යයන් සඳහා අදාළ ලෙස විවිධ උපාංග සම්බන්ධ කර ඇත. එසේ අත් යන්ත්‍රවලට සවිකර ඇති "අළුව" නම් උකරණය මගින් කෙරෙන කාර්යය වන්නේ,
(1) නූල් විවර ලබා ගැනීමට සහය වීමයි.
(2) විවීමේදී හරස් නූල් තද කරගැනීමට සහාය වීමයි.
(3) පුඩුවැල් ජේලි උස් පහත් කරවීමයි.
(4) පාපොලු සම්බන්ධ කිරීමේ කාර්යයයි.

31. භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන මැටි හඳුනා ගැනීමේ පහසුව සඳහා වර්ග කර ඇත්තේ,
(1) ප්‍රාථමික මැටි සහ ශේෂ මැටි ලෙසට ය. (2) ද්විතීයික මැටි සහ දියළු මැටි ලෙසට ය.
(3) ප්‍රාථමික මැටි සහ ද්විතීයික මැටි ලෙසට ය. (4) ද්විතීයික මැටි සහ අගම් මැටි ලෙසට ය.

32. පෝසිලේන් භාණ්ඩ නිපදවීමට භාවිත කෙරෙන රසායනික ජල අණු දෙකක් සහ ඉතා අඩු යකඩ ප්‍රතිශතයක් අඩංගු ඇලෙන සුළු (Plasticity) අමුද්‍රව්‍යය වන්නේ,
(1) කෙඔලනයිට් ය. (Kaolaniet) (2) බෙන්ටොනයිට් ය. (Bentoniet)
(3) ෆෙල්ස්පාර් ය. (Feldspar) (4) කෙඔලින් ය. (Kaolin)

[පස්වැනි පිටුව බලන්න.

33. පිගන් භාණ්ඩ නිෂ්පාදනයේ දී ඔප (Glaze) මිශ්‍රණයට ඛණිජ වර්ග යොදා වීදුරුමය විනිවිද පෙනෙන ලක්ෂණ ලබා ගන්නා අතර වර්ණය ලබා ගැනීමට යොදා ගනු ලබන්නේ,

(1) ඔක්සයිඩ් වර්ග ය. (2) අම්ල වර්ග ය. (3) පාෂාණ වර්ග ය. (4) මැටි වර්ග ය.

34. උසස් ප්‍රමිතිගත භාණ්ඩ නිපදවීමේ දී යොදනු ලබන නොඇලෙනසුළු අමුද්‍රව්‍ය යන්ත්‍රානුසාරයෙන් කුඩු බවට පත් කර ගැනේ. එම ක්‍රියාවලියට යොද ගනු ලබන යන්ත්‍රය වන්නේ,

(1) බෝල් මිල් යන්ත්‍රයයි. (Boll mill) (2) පග්මිල් යන්ත්‍රයයි. (Pug mill)
(3) ජෝ ක්‍රෂර් යන්ත්‍රයයි. (Joy crusher) (4) ෆිල්ටර් ප්‍රෙෂ් යන්ත්‍රයයි. (Filter Press)

35. පහත රූප සටහන් මගින් දක්වා ඇති මැටි භාණ්ඩ අතුරින් නිදහස් අතින් සකස් කළ හැකි භාණ්ඩ මොනවා ද?



(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි. (4) B සහ D පමණි.

36. සකස් කර ගත් මැටි භාණ්ඩ පෝරණු භාවිතයෙන් පිළිස්සීමට ලක් කරයි. මැටි භාණ්ඩ පිළිස්සීමේ දී සිදු **නොවන** වෙනස්කම වනුයේ,

(1) සැහැල්ලු බවට පත් වීමයි.
(2) ජලය රඳවා තබා ගැනීමට හැකි තත්ත්වයට පත් වීමයි.
(3) සුමුදු මතුපිටක් ලැබීමයි.
(4) වර්ණය වෙනස් නොවීමයි.

37. මැටි භාණ්ඩ අලංකරණය සඳහා පහත ක්‍රම භාවිතයේ පවතී.

A - කැටයම් කිරීම
B - මාබල් රටා යෙදීම
C - දිස්න දැමීම
D - ඩෙකෝපාජ් රටා යෙදීම

ඉහත ක්‍රම අතුරින් බිස්කට් තත්ත්වයට පුළුස්සන ලද මැටි බඳුනක් අලංකරණය කිරීමට යෙදිය හැකි අලංකරණ ක්‍රම වන්නේ,

(1) B සහ D පමණි. (2) A, B සහ C පමණි.
(3) A, C සහ D පමණි. (4) B, C සහ D පමණි.

38. සකපෝරුව භාවිතයෙන් බඳුන් ඉදිකිරීමේ දී මැටි පිඩ මධ්‍යගත කිරීම තුළින් අපේක්ෂා කරනු ලබන්නේ,

(1) බඳුනේ සමබරතාවය රඳවා ගැනීම ය.
(2) බඳුනේ උස ප්‍රමාණය පවත්වා ගැනීම ය.
(3) බඳුනේ පතුල නිසි ලෙස සකස් කිරීම ය.
(4) බඳුන සකපෝරුවෙන් ඉවත් කර ගැනීමේ පහසුබව ය.

39. රූපයේ දැක්වෙන්නේ දේශීය පෝරණුවක ආකෘතියකි. එහි A, B, C, D අක්ෂරවලින් පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) භාණ්ඩ අසුරන ස්ථානය, උදුන, පිදුරු තට්ටුව, මැටි තට්ටුව වේ.
(2) පිදුරු තට්ටුව, උදුන, භාණ්ඩ අසුරන ස්ථානය, මැටි තට්ටුව වේ.
(3) උදුන, භාණ්ඩ අසුරන ස්ථානය, පිදුරු තට්ටුව, මැටි තට්ටුව වේ.
(4) උදුන, භාණ්ඩ අසුරන ස්ථානය, මැටි තට්ටුව, පිදුරු තට්ටුව වේ.



40. පාසලේ විදුහල්පති කාර්යාලය ඉදිරිපිට එළිමහනේ තැබීමට සුදුසු මූර්තියක් සකස් කිරීමේ කාර්යය ඔබට පැවරී ඇත. එම නිර්මාණය සඳහා යොදා ගනු ලබන වඩාත් සුදුසු මාධ්‍යය හා ක්‍රමය විය යුත්තේ,

(1) පල්ප මාධ්‍යය හා අර්ධ උන්නත ක්‍රමයයි. (2) සිමෙන්ති මාධ්‍යය හා පූර්ණ උන්නත ක්‍රමයයි.
(3) මැටි මාධ්‍යය හා අල්ප උන්නත ක්‍රමයයි. (4) යකඩ මාධ්‍යය හා අර්ධ උන්නත ක්‍රමයයි.

* *

[හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

84 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

ශිල්ප කලා I, II
நுண்கலை I, II
Arts and Crafts I, II

ශිල්ප කලා II

✳ **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. ප්‍රදේශයේ පාසල් කිහිපයක සිසුන් සඳහා නායකත්ව පුහුණු කඳවුරක් ඔබ පාසල ප්‍රධානත්වයෙන් සිදු කිරීමට යෝජනා වී ඇත. එම වැඩසටහනේ බොහෝ කාර්යයන් ශිල්ප කලා විෂය හදාරණ සිසුනට පැවරීමට අපේක්ෂිත ය.

(i) නායකත්ව පුහුණුව පිළිබඳ ප්‍රදේශයේ පාසල් දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ii) නායකත්ව පුහුණු වැඩසටහනේ සම්පත්දායකයින් සහ ආරාධිත අමුත්තන්ට යැවීමට සුදුසු පේපර් ක්විලින් (paper quelling) ආශ්‍රිත ඇරයුම් පතක මුහුණත චිත්‍රණය කර දක්වන්න.

(iii) පුහුණු කඳවුරට බාහිරින් පැමිණෙන සිසුන්ට පැළඳවීම සඳහා සුදුසු නිර්මාණශීලි ලාංඡනයක් ඇඳ දක්වන්න.

(iv) බාහිරින් පැමිණෙන සිසුන් හා අමුත්තන් පිළිගැනීමට පාසල් නර්තන කණ්ඩායමට එක ම මෝස්තරයේ ගෙල පළඳනා සකස් කිරීමට යොදා ගත හැකි පරිසර සම්පත් **දෙකක්** නම් කරන්න.

(v) පුහුණු කඳවුර තුළ භාවිත කරන උපකරණ තබා ගැනීම සඳහා බෑගයක් භාවිත කළ යුතු අතර එය පරිසර හිතකාමී මාධ්‍යයකින් සකසා තිබිය යුතු ය. ඒ සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(vi) කඳවුරු භූමියේ දිවා ආහාරය පිළිගන්වන ස්ථානය අලංකාර කිරීමට සුදුසු මල් සැකසුමක් ඇඳ දක්වන්න.

(vii) කණ්ඩායම් ක්‍රියාකාරමකදී නිම වූ, විසිතුරු මැහුම් ක්‍රමවලින් අලංකාර කරන ලද කුෂන් කවරයක නිෂ්පාදන වියදම රුපියල් 600ක් වන අතර එය 20% ක ලාභයක් සහිතව විකිණීමට අපේක්ෂිත ය. එහි විකුණුම් මිල ගණනය කරන්න.

(viii) පුහුණු කඳවුරට සහභාගී වන එක් කණ්ඩායමකට ලැබුණු අභියෝගය වන්නේ අමුත්තන්ට පිළිගන්වන කෙටි ආහාර ඇසිරීම සඳහා සුදුසු ඇසුරුමක් සකස් කිරීම ය. ඊට ගැළපෙන නිර්මාණශීලි ඇසුරුමක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

(ix) කණ්ඩායම් ස්ථානගත වීම හඳුනා ගැනීම සඳහා වර්ණ කොඩි භාවිත කිරීමට උපදෙස් ලබා දීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා සකස් කළ හැකි නිර්මාණශීලි කොඩියක් වියමන් රටා ඇසුරින් ඇඳ දක්වන්න.

(x) සහභාගී වූ සෑම පාසල් සිසුවෙකුට ම පිරිනැමීමට සුදුසු, මැටි ඇසුරින් නිර්මාණය කළ හැකි සමරු තිළිණයක් සඳහා උචිත නිර්මාණාත්මක නිමැවුමක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

2. භෞතික සම්පත් නිර්මාණයේ දී සැලසුම් චිත්‍ර ඇඳීම තුළින් නිර්මාණයේ නිවැරදි හැඩතල හා මිනුම් භාවිත කර නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කළ හැකි ය.

(i) පන්ති කාමරයක ප්‍රදර්ශනය කරන බිත්ති පුවත්පත් රඳවනය සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල **දෙකක්** ඇඳ දක්වන්න.

(ii) 4 cm අරය සහිත වෘත්තයක් ඇඳ කේන්ද්‍රික ඛණ්ඩය, ජ්‍යාය, වෘත්ත ඛණ්ඩය සලකුණු කරන්න.

(iii) පාදයක දිග 3 cm උස 4 cm වූ සවිධි පංචාස්‍රාකාර හැඩැති තේ ඇසුරුමක විකසනය ඇඳ දක්වන්න.

[හත්වැනි පිටුව බලන්න.

3. රෙදිපිළි අලංකාරණය මෙන්ම ගෘහ අලංකරණ නිර්මාණ මගින් ද තම පරිසරය වර්ණවත් කර ගැනීම අද බහුලව සිදුවන්නකි.

(i) ගෘහ අලංකරණයක් ලෙස කඩදාසි ආශ්‍රිතව සකස් කරනු ලබන මල් සැරසිලිවලට දීප්තියක් ලබා දෙමින් කල්තබා ගැනීමට යොදා ගනු ලබන ක්‍රමවේදයක් දක්වන්න.

(ii) "රිබන් වර්ක්" (Ribbon work) ක්‍රමය භාවිත කරමින් කුෂන් කවරයක් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(iii) ක්‍රීඩා ඇඳුමක ඉදිරිපස අලංකරණයක් ලෙස තිර රාමු මුද්‍රණයට (Screen Printing) සුදුසු මෝස්තරයක් ඇඳ මුද්‍රණය **නොවිය** යුතු කොටස් සේයා කර දක්වන්න.

4. අත් පිස්නා හැදයක් වියා ගැනීම සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූප සටහන සහ විස්තරය පහත දැක්වේ.



- ✳ හැදයේ දිග මීටර් 100 කි.
- ✳ හැදයේ පළල සෙන්ටිමීටර් 40 කි.
- ✳ එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 50 කි.
- ✳ දික් නූලේ අංකය $2 / 20^{S}$ ක් වේ.

(i) අත් පිස්නා වියීමට භාවිත කරන රටාවක් නම් කරන්න.

(ii) අත් පිස්නා හැදය වියීමට අවශ්‍ය දික්නූල් ප්‍රමාණය ගණනය කරන්න.

(iii) කලිසම් රෙදි වියීමට භාවිත කරන 'සරළහීරි වියමනේ' ඒකක **දෙකක්** ප්‍රස්තාර ගත කර දක්වන්න.

5. රෙදිපිළි නිෂ්පාදනයේදී අවශ්‍යතාව මෙන්ම අලංකරණය පිළිබඳව ද අවධානය යොමු කර ඇති බව පෙනේ.

(i) 'පැච් වර්ක්' ක්‍රමයට බිත්ති සැරසිල්ලක් නිර්මාණය කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල ආශ්‍රිත නිර්මාණයක් ඇඳ දක්වන්න.

(ii) රෙදි මුද්‍රණය සඳහා පරිසර හිතකාමී මාධ්‍යයකින් කුඩා අච්චුවක් සකස් කරන ආකාරය රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.

(iii) වියීමේ යන්ත්‍රයට සවිකර ඇති 'පනාව' (Reed) රූප සටහනකින් දක්වා ඒ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

6. මැටි ආශ්‍රිත නිර්මාණ සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිතයට ගැනේ.

(i) මැටි භාණ්ඩ පිළිස්සීමේදී විදුලිය හා ගෑස් භාවිත වන පෝරණු වර්ග **දෙකක්** නම් කරන්න.

(ii) හම් පදම් අවස්ථාවේදී මැටි භාණ්ඩයක් අලංකාර කිරීම සඳහා භාවිත වන ශිල්පීය ක්‍රම **දෙකක්** නම් කර ඒවා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(iii) මැටි දරණු ආශ්‍රිතව මැටි භාණ්ඩයක් ගොඩනගා ගන්නා ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න.

7. පූර්ව ශිලා යුගයේ සිටම උද්‍යාන අලංකරණ නිර්මාණ පැවති බවට බොහෝ සාක්ෂි ඇත.

(i) නිවසක ඉදිරිපස අලංකරණය සඳහා යොදා ගත හැකි බිතු කැටයමක් අඳින්න.

(ii) පූර්ණ උන්නත මූර්තියක් යනු කුමක්දැයි පැහැදිලි කර උදාහරණ **දෙකක්** දෙන්න.

(iii) පල්ප මාධ්‍යයෙන් මූර්තියක් නිර්මාණයක් කරන ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න.

✳✳✳